# ආලින්දය



අද ආලින්දයට කැඳවාගෙන එන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ උප සභාපති හිටපු ලේකම් කැලණිය විශ්වවිද්‍යාලයේ ඊ ලර්නිං අංශයේ මහාචාර්ය රෝහණ ලක්ෂමන් පියදාස මැතිතුමා

**සන්නස** ආයිබෝවන් මහාචාර්යතුමනි මම කැමැතියි මුලින්ම ඔබතුමාගේ ළමා කාලය පාසැල් ජීවිතය සහ විශ්වවිද්‍යාල ජීවිතය පිළිබඳ යමක් දැනගන්න.

**මහාචාර්ය තුමා** ආයුබෝවන් චිත්‍රාන් . අපි හැමොටම තියනවානේ සුන්දර ළමා වියක්. මගේ මව ගුරුවරියක්,පියා බන්ධනාගාර නිලධාරියෙක් ,ඉතිං මගේ පියා මගේ මව සේවය කරන පාසල අවටින් තමයි ඒ දවස් වල ගෙයක් කුලියට ගන්නේ. ඒ දවස්වල මගේ මව රැකියාව කරල තියෙන්නෙ වළල මධ්‍ය මහා විද්‍යාලෙ .ඒ නිසා අපි ගෙයක් අරන් ඉඳලා තියෙනවා මැණික්හින්න ප්‍රදේශයෙන්. මම මුලින්ම ඉගෙන ගන්න ගියේ වලල මධ්‍ය මහා විද්‍යාලයටහෝඩියේ පන්තිය. ඉතින් මගේ මනසේ සිහිනයක් වගේ ඇඳිලා තියෙනවා විශාල පිට්ටනියක් සහිත ඒ පාසැල.මම දෙවැනි පන්තියට එන විට අම්මට මාරුවක් ලැබෙනව පිලිමතලාව මහා විද්‍යාලයට. මේ හේතුව නිසා මම දෙවැනි පන්තියට යන්නේ හැරම්ටිගල ධීරානන්ද මහා විද්‍යාලයට. මෙය මිශ්‍ර පාසලක්.මම හය වෙනි පන්තිය දක්වාම ගියේ මේ පාසැලට. ඒ විද්‍යාලයේ අපි හිටියේ කටුමැටි ගහපු ශාලාවක. මෙය මිශ්‍ර පාසලක් නිසා අපිට හරිම සුන්දරයි. අපිට ඒ කාලේ දවල්ට කිරි හම්බවෙනව ඉස්කෝලෙන්, ඒ වගේම බනිස් හම්බවෙනවා. ඒ උනාට හැමදාම උදේට අම්මා මට කෑම ටිකක් ඔතලා දෙනවා. මං ඒකත් කනවා බනිසුත් කනවා. අපිට හරි අපූරුයි සිකුරාදා දවස මොකද අපේ එදාට ගොම ගෙනියන්න ඕන, වතුර ඇදල දෙන්න ඕන, ගෑනු ළමයි ඒ ශාලාවේ බිම මැටි මිශ්‍ර ගොම ගානවා. සඳුදට ඉස්කෝලේ හරි සුවඳයි. දවස් දෙකක් වේලිලා. සුමාන දෙකකට සැරයක් අපි ගෙනියනවා එඬරු කිරි පහන් දැලි. මොකද ඒවායින් තමයි අපේ කලු ලෑලි කළු කරන්නෙ. ඒකත් අපේ වැඩක්. මේ කාලෙ සරම් ඇඳගෙන හිටපු යාලුවොත් අපේ පන්තියේ හිටියා. මගේ පන්තියේ හිටිය බර්ගර් ළමයි. මට මතකයි සිත්තියා කියලා ගෑනු ළමයෙක් හිටියා. සාමිනාදන් කියලා දෙමළ යාළුවෙක් හිටියා . නිසාර් කියලා මුස්ලිම් යාළුවෙක් හිටියා. අපේ පන්තිය බහුවාර්ගිකයි බහු සංස්කෘතිකයි. ඒ නිසා ජාතීන් අතර සුහදතාවය පාසල තුළදීම වැඩෙමින් තිබුණේ. හයේ පන්තියේදී මට පිළිමතලාව මහා විද්‍යාලයට එන්න උනේ මගේ මවට එහාට මාරුවක් ලැබුන නිසා. මේ ඉස්කෝලෙදි කලින් ඉස්කෝලේ වගේ සරම් අඳින ළමයි පාවහන් නොපළඳින ළමයි හිටියේ නෑ. මේ පාසලේ හොඳ විනයක් තිබුණා. සියලුම දෙනා කලිසම් සුදු කමිස ඇදලා පාවහන් පැලඳිය යුතු ව තිබුණා. මේක පාසල් වල ජනසතු කරන්න කලින් පෞද්ගලික අංශය යටතේ තිබුණු පාසලක්. මේ විද්‍යාලයේදී මම ක්‍රීඩාවලට සම්බන්ධ වුණා නොයෙකුත් සමිති සමාගම් වල වැඩට සම්බන්ධ වුණා මේ ඉස්කෝලෙ හොඳ පුස්තකාලයක් තිබුණා මට නොයෙක් පොත්පත් කියවන්න ලැබුන.

මම හය වෙනි ශ්‍රේණියේ ඉගෙන ගන්නකොට ඊළඟට අම්මට ලැබුණා හනුවර පුෂ්පදාන විද්‍යාලයට මාරුවක්. තාත්තා වැඩ කළේ බන්ධනාගාර නිලධාරියෙක් විදියට නිසා අපි ඇවිල්ල පදිංචි වුණේ බන්ධනාගාර නිලනිවාස වල. ඊට පස්සේ මට ඇතුල් වෙන්න වුණා මහනුවර විද්‍යාලයකට. මම ගියේ නුවර විද්‍යාර්ථ විද්‍යාලයට. මෙතන මා කලින් ඉගෙන ගත් පාසල්වලට වඩා වෙනස්. මෙතෙක් මා ඉගෙන ගත්තේ මිශ්‍ර පාසල් වල. විද්‍යාර්ථ කියන්නේ පිරිමි ළමයි ඉගෙන ගන්න පාසලක්. මේ ඉස්කෝලේ ඉතා තද නීති රීති තිබුණා. මට ටිකක් නුහුරු කමකුත් දැනුනා. මොකද මේ ඉස්කෝලේ ගෑනු ලමයි නෑ ,කලින් ඉස්කෝලවල අපිට ගෑණු පිරිමි භේදයක් තිබුණෙ නෑ. අපි අපේ අක්කලා නංගිලා වගේ ඒ ගොල්ලො ආශ්‍රය කළා. කලින් ඉස්කෝල වල අය ඉතා සුහදයි. ඉතා මිත්‍රයි. මේ ඉස්කෝලෙට ආවම කෘතිම කමක් මට දැනෙන්න පටන් ගත්තා. කලින් ඉස්කෝලෙදි අපි මලල ක්‍රීඩා



කලාට මේ ඉස්කෝලේ ක්‍රිකට් තිබුණා, රගර් තිබුණා, මට ඒ ගැන දැනීමක් තිබුනේ නෑ. පස්සේ පස්සේ ඒවත් මට හුරු වුනා. මේ දිනවල මගේ කැමතිම විෂය වෙලා තිබුණේ ඉතිහාසය.ඒකට ඒ විෂය උගන්වපු අභයගුණවර්ධනගුරුතුමියගේ සිත්ගන්නා සුළු ඉගැන්වීම් විලාශය බලපෑවා කියලා මට හිතෙනවා. ඒ වගේම මම අදක්ෂම විෂය තමයි ගණිතය. ගණිතයට මට තිබුණේ ඉතාමත්ම අඩු ලකුණු සංඛ්‍යාවක්. පාසලේ ප්‍රගති වාර්තාව මම තාත්තට පේන්න තිබ්බේ නෑ.

මම සාමාන්‍ය පෙළ සමත් වෙලා උසස් පෙළ පන්තියට ඉගෙනීමට ගියා. මේ පංතියේ හිටියේ ළමයි ටික දෙනයි. ක්‍රීඩාවලට හා වෙනත් වැඩ කටයුතුවල යෙදෙන නිසා හරිහැටි ඉගැන්වීම් කෙරුණේ නෑ. මගේ අවශ්‍යතාවය තිබුණෙ කොහොම හරි විශ්ව විද්‍යාලයට යන්න. මේ හේතුව නිසා මමත් අම්මත් එක්ක ගිහිල්ලා නුගවෙල මධ්‍ය මහා විද්‍යාලයෙ විදුහල්පතිතුමාගෙන් ඇහුවා මේ ඉස්කෝලෙට ඇතුල් වෙන්න පුළුවන්ද කියලා. නමුත් ඊට අවසර ලැබුණේ නෑ. මේ හේතුව නිසා මම ගියා මා කලින් ඉගෙනගත්ත පිළිමතලාව මහා විද්‍යාලයට . ඒ ඉස්කෝලේ මාව ආපහු බාර ගත්තා.

මේ කාලයේදී මහනුවර නගරය පූජා නගරයක් කරනවා කියලා ලොකු උනන්දුවක් තිබුණා. නමුත් පූජානගරය කළේ නැහැ. ශුද්ධ නගරයක් කරනවා කියලා කණු හතරක් පිහිටෙව්වා. මමත් ඔය උත්සවය බලන්න ගියා.මේ උත්සවයට ගියාම මට තේරුණා මේ ගොල්ලො කරන්නෙ නියමිත වැඩ නෙමෙයි ප්‍රෝඩාවක් කියලා. මම බැලුවා ඒ උත්සවයට පැමිණෙන අයට වාඩිවෙන්න තබපු පුටු දිහා. ඇවිල්ල හිටියේ සුළු ප්‍රමාණයක්. ඒ සැරේ මම ලිපියක් ලිව්වා මහනුවරට "කණු තියෙනවා මම දුටිමි'' කියලා. ඒක ලියා පදිංචි තැපෑලෙන් පත්තරේට යැව්වා. ඒ කාලේ රිවිරැස පත්තරේ හිටියෙ ගුණදාස ලියනගේ මහත්මයා කතෘ විදියට. මට හරිම පුදුමයි, ඒ පත්තරේ විශේෂ ලිපියක් විදියට මේක වර්ණ ගන්නල ලොකු අකුරෙන් මාතෘකාව ලියලා මහනුවර සිට රෝහණ ලක්ෂමන් වාර්තා කරයි කියල ඒ ලිපිය රිවිරැස පත්තරේ පළ කරල තිබුන. මේක මට අමුතුම විදියේ ආශ්වාදයක් අත්දැකීමක් වුණා. ඊට පස්සේ ඔය ගැන ගුරුවරු මාත් එක්ක කතා කරන්න ගත්තා, වැඩිහිටියෝ මාත් එක්ක කතා කරන්න ගත්තා, මාව දැකපු අඳුරන කට්ටිය මගෙන් ඇහුවා, යාලුවෝ මගෙන් ඇහුවා, ඒ යුගයේ පත්තරේක ලිපියක් පළ වෙනවා කියන එක සුවිශේෂී සිද්ධියක්. මාව ලේඛකයෙක් කියලා බෞතිස්ම උනේ එතනින් කියලා මට හිතෙනවා.ඊට පස්සේ මම දිගින් දිගටම ලියන්න පටන් ගත්තා සතියකට ලිපි විස්සක් විතර ලියනවා. හැම පත්තරේකම යවනවා ඉතිං එයින් දහයක් විතර පලවෙනවා. එතන ඉදලා මට ලේඛකයෙක් විදියට නමක් හදාගන්න පුළුවන් වුණා.

මට මතකයි අපේ උසස් පෙළ පංතියට නොයෙක් පිටස්තර පුද්ගලයින් පැමිණෙනව. ඔවුන් ඇවිල්ල සමහර අයගේ අතට කොළ කෑලි දීලා යනවා. දවසක් මගේ යාළුවෙක් ඇහුවා පොඩි සාකච්ඡාවක් තියෙනවා ඔයාට එන්න පුලුවන්ද කියලා. අපේ ගෙදරට ඒ දවස්වල ඇත්ත පත්තරය වගේ වමේ පත්තර ගේනවා. මගේ තාත්ත වාමාංශිකයෙක්. මේ නිසාම මට තිබුණා යම්කිසි දේශපාලන කියවීමක්. දේශපාලන අවබෝධයක්, ඒ දවස් වල බණ්ඩාරනායකලා තමා අපේ වීරයෝ, තාත්තගේ වීරයන් උනෙත් බණ්ඩාරනායකලා. ඉතින් එදා අර යාළුවෝ එන්න කියපු සාකච්ඡාවට මම ගියා. ඒකට ආවේ කොළඹ වෛද්‍ය විද්‍යාලයේ ශිෂ්‍යයෙක් කියල කෙනෙක්. මේ සාකච්චාවේදී මාත් එක්ක විවාදයක් ඇතිවුණා. මගේ දැනුම සීමාවට අනුව මම කතා කළා. එතකොට අර ශිෂ්‍යයා කිව්වා ඔයත් එක්ක කතා කරන්න වෙන මහත්තයෙක් එක්කරගෙන එන්න ඕනි කියල. දෙවෙනි දවසේ මම සාකච්ඡාවට ගියා. එදා ආවෙ අරයම තමා. මම දැනගත්තා මේක වෙන ව්‍යාපාරයක් කියලා.. ඔය අතරතුරේ ජනතා විමුක්ති පෙරමුණේ කැරැල්ල ආව. තාත්ත අපිට දිග කලිසම් අදින්න දුන්නේ නෑ. මොකද එතකොට අපි තරුණය විදියට පේන නිසා.. දවසක් මම තාත්තත් එක්ක නගරයට ගිහිල්ලා එනකොට මම දැක්කා අර දේශනා කරපු එක්කෙනා පොලිසියේ වැටක් ගහනවා. එයා අත්අඩංගුවට අරගෙන පොලිසිය එක එක වැඩ වලට යොදවලා. එයා දැක්ක ගමන් මම පුදුම වේගෙකින් දිව්වා. ඈතට ගිහිල්ලා බැලුවා එයාමද කියලා ඔව් එයාම තමයි. තාත්තා අහනවා මගෙන් දිව්වෙ මොකද කියලා. කැරැල්ල නිසා අපිට ඉස්කෝලේ දීර්ඝ නිවාඩුවක් ලැබුණා.නිවාඩුව ඉවර වෙලා ඉස්කෝලේ ගියහම අපිට දේශපාලන විද්‍යාව උගන්වපු ගුරුතුමිය මගේ ළඟට ඇවිත් කිව්වා මම හරි බයෙන් හිටියේ ඔයත් අත්අඩංගුවට අරගෙන කියලා. මොකද ඔයා හැමතිස්සෙම දේශපාලනය ගැන මාත් එක්ක විවාද කරනවනේ. ඒ සේනානායක ගුරුතුමිය කඩුගන්නාව පොලිසියේ ප්‍රධානියාගේ භාර්යාව. අපේ පංතියේ කීප දෙනෙක් අත්අඩංගුවට පත්වෙලා තිබුන.

මම උසස් පෙළ සමත් වෙලා කැලණිය විශ්ව විද්‍යාලයට තේරුණා. ඒ වනවිට මම ලේඛකයෙක් හැටියට නමක් හදාගෙන තිබුණෙ .ඔය දවස් වල මම සිනමාව පිළිබඳ විචාරයක් ලිව්වා.මෙහිදී විචාර සඳහා තරුණයන්ට හිමි සම්මානය මට ලැබුණේ. මේකත් මට ආලෝකයක් වුණා.
අපිට විශ්වවිද්‍යාලයේ පළවෙනි වසරේ නේවාසිකාගාර ලැබුණේ නෑ. මේ හේතුව නිසා විද්‍යාලංකාර පිරිවෙනේ තිබුණු උපකුලපතිගේ නිල නිවසේ සමහරු නතරවෙලා හිටිය බලහත්කාරයෙන්. මගේ යාළුවෝ කිව්වා මටත් එතැනට ගිහිල්ලා නතර වෙන්න කියලා. මමත් එතන නතර වුණා. ඔය කාලේ නවක වදය කොමිසම කියන එකෙන් සොයාගෙන තියෙනවා ශිෂ්‍යයන්ට නවක වදය දෙන්නේ උපකුලපතිගේ නිල නිවසේ කියලා මේ හේතුව නිසා එතන නතර වෙලා හිටපු මගේ ශිෂ්‍යභාවය වසරකට තහනම් කළා. මගේ බලාපොරොත්තුවක් තිබුනේ දෙවැනි වසරේ ඉඳලා විශේෂවේදී උපාධිය කරන්න. එය අහිමිවීම මට කනගාටුවක් ගෙනදුන්නා. ඉතින් මට දැන් ගෙදර යන්නත් බෑ. මම



කාමරයක නතර වෙලා ඉන්නකොට මට සෙංගමාලය හැදුනා. ඉතිං ගෙදර යන්න විශ්ව සිදුවුණා. මේ අතරේ විශ්වවිද්‍යාලයෙන් ගෙදරට ලියුමක් යවලා තිබුණා මගේ ශිෂ්‍යභාවය තහනම් කළා කියලා. එතකොට අම්ම කිව්වා ඔයා වරදක් කරලා නෙමෙයිනේ, ටික කාලයක් ගෙදර ඉන්න කියලා. ඒ වෙලාවේ අම්මා මාව තේරුම් ගැනීම මට ලොකු සහනයක් වුණා. ඔය දවස් වල මහනුවර පෙරහැර පටන් ගත්තා. මෙහි නිවේදන කටයුතු සඳහා මාව තෝරා ගත්තා. ඒක මට ලොකු සතුටක්. මට පෙරහැර බලන්නත් ලැබෙනවා වගේම අතට මුදලකුත් ලැබෙනවා. මේක හරි විනෝදකාමී වැඩක්. ඔය කාලෙ විශ්වවිද්‍යාලයෙනි නිලවරණය ආවා. ඒකෙන් ඒ දවස්වල මමත් වැඩ කරපු සමාජවාදී කඳවුර ජයග්‍රහණය කළා. ඒගොල්ලො ඉල්ලීමක් කළා මගේ පන්ති තහනම් කළේ නවක වදය සම්බන්ධව නොවෙයි. උප කුලපති නිල නිවසේ නතර වී සිටීම නිසා බැවින් මගේ ශිෂ්‍යභාවය ලබාදෙන ලෙසට. ඒ අනුව මට නැවතත් විශ්ව විද්‍යාලයට එන්න ලැබුන. ඒ වෙලාව වෙනකොට විශේෂවේදී පාඨමාලාවට ශිෂ්‍යයින් තෝරගෙන ඉවරයි. මම ගිහිල්ලා මගේ අවශ්‍යතාවය උපකුලපතිතුමාට කිව්වා. එතුමා කිව්වා එහෙම කරන්න බෑ කියලා. ඔය වෙලාවෙදි මට මුණ ගැහුණා සිංහල අංශයේ කථිකාචාර්යවරයෙක් හැටියට හිටපු සුනිල් ආරියරත්න මහත්මයා. මම එතුමාට මගේ දුක්ගැනවිල්ල කිව්වා. එතකොට එතුමා කිව්වා ඔයාට කරන්න බැරිනම් කාටද කරන්නේ කියලා මාව එක්ක ගියා ජනසන්නිවේදන අංශයේ අංශාධිපති විමල් දිසානායක මහත්මයා ළඟට. නැවත මට අවස්ථාව ලැබුණා ජන සන්නිවේදන විශේෂවේදී පාඨමාලාව කරන්න. මෙහිදී මගේ සියලු ක්‍රියාකාරකම් නැවත අවදි වන්නට පටන් ගත්තා.
මේ දවස් වල අපේ රටේ කඩදාසි හිඟයක් ඇති වුණා. මම පත්තර කන්තෝරු වලට ගිහිල්ලා එතනින් කැපිල ඉවත් කරන්න කඩදාසි ඉල්ලා ගත්තා. මේකෙන් පත්තරයක් පටන් ගත්තා වීශ්වවිද්‍යාලය තුළ "කොලය'' කියලා. මේක සුළු ගානකට විකුනල ඒ එන මුදලින් නැවතත් කඩදාසි අරගෙන මේක දිගටම කරගෙන ගියා. ඒ කාලේ නමකුත් පටබැඳුණා කොලය කියලා. මේක හරි රසවත් දෙයක් වුණා. අපි මේකෙ කලාප අටක් විතර මුද්‍රණය කලා. මේ යුගයේ මම සියලුම පත්තර වලට

48 වන පිටට